මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව |
| දිනය | 2026 ජනවාරි 30 |

**ශ්‍රී ලංකා මහ බැංකුව 'වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව - 2025 දෙසැම්බර්' ප්‍රකාශයට පත් කරයි.**

ශ්‍රී ලංකා මහ බැංකුව (මහ බැංකුව) 2026 ජනවාරි 30වන දින එහි නවතම වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව (Market Operations Report) ප්‍රකාශයට පත් කොට ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් මත පදනම්ව සහ නම්‍යශීලී විදේශ විනිමය අනුපාතික ක්‍රමයක සහය ඇතිව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, මහ බැංකුව විසින් සිදු කරනු ලබන මුදල් මෙහෙයුම් සහ විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳව පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය සහ අවබෝධය වැඩිදියුණු කිරීම මෙම වෙළඳපොළ මෙහෙයුම් වාර්තාවේ අරමුණයි.

'වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව - 2025 දෙසැම්බර්' මගින් 2025 වසරේ දෙවන භාගය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ද්‍රවශීලතා ප්‍රවණතා, කෙටිකාලීන පොලී අනුපාතික සහ විනිමය අනුපාතිකයෙහි හැසිරීම මෙන්ම මහ බැංකුව විසින් සිදු කරනු ලබන මුදල් වෙළඳපොළ සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් කටයුතු පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරයි. තවද, එය කාලෝචිත මාතෘකා පිළිබඳ විශේෂාංග ලිපි දෙකක් ද ඉදිරිපත් කරනු ලබන අතර, වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සහ ක්‍රියාකාරකම් පිළිබඳව තෝරාගත් දර්ශක ද එහි ඇතුළත් වේ.

**සුවිශේෂී සිදුවීම්**

- 2025 වසර තුළදී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩවම අතිරික්තයක පැවතිණි.
- දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අඛණ්ඩ ද්‍රවශීලතා අතිරික්තය සැලකිල්ලට ගනිමින් මහ බැංකුව 2025 වසරේ ජනවාරි මස අග භාගයේ සිට අමතර ද්‍රවශීලතාවක් වෙළඳපොළට සැපයීම සඳහා විවට වෙළඳපොළ කටයුතු සිදු නොකළේය.
- 2025 වසරේ පළමු භාගයේදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR), ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ පුළුල් ලෙස සමපාත විය. එහෙත්, ද්‍රවශීලතාව බැංකු කිහිපයක් මත සංකේන්ද්‍රණය වීම හේතුවෙන් 2025 වසරේ ජූලි මස මැද භාගයේ සිට එය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙන් බැහැරට ගමන් කළ අතර, 2026 වසරේ ජනවාරි මාසයේදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමග සමපාත විය.
- දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ඉල්ලුම සහ සැපයුම් තත්ත්වයන් පිළිබිඹු කරමින්, 2025 වසර තුළ දී, එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් අවප්‍රමාණය විය.
- විදේශ සංචිත ගොඩනැගීම සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වූ අතර, අවශ්‍ය වූ විට, විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන සීමා කිරීම සඳහා ද මැදිහත් විය.
- 2025 වසර තුළදී, පියවීමේ දින පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් බිලියන 2.0ක් විය. එය 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.8ක් වූ අතර ආර්ථික අර්බුධයෙන් පසු වාර්තා වූ ඉහළම දළ නිල සංචිත මට්ටම වාර්තා කිරීම සඳහා එය උපකාරී විය.
- අන්තර් බැංකු වෙළෙඳපොළ සාමාන්‍යකරණය වීමේ තත්ත්වයක් පෙන්නුම් කර ඇති අතර, වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු වී ඇත.

මෙම ප්‍රකාශනයෙහි විද්‍යුත් පිටපතක් සහ වෙළඳපොළ මෙහෙයුම් සහ වෙළඳපොළ වෙනස්වීම් පිළිබඳ සංක්ෂිප්ත රූප සටහනක් මහ බැංකුවේ වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකිය.

**සබැඳිය:**

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/market_operations_report_december_2025_s.pdf

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/market_operations_report_december_infographic_2025_s.pdf

